# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර
# Bhiksu University of Sri Lanka - Anuradhapura

**2017/2018 අධ්‍යයන වර්ෂය - සමාසික 1 පරීක්ෂණය**
**තෙවන වසර**
**2017/2018 Academic Year - Semester 1 Examination**
**Third Year**

## පාසල් හා පිරිවෙන් කළමනාකරණය – EDSC 31013

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න. කාලය පැය 02 යි.

---

01.

I. කාර්යක්ෂමතාව සහ ඵලදායිත්වය වෙන වෙනම විග්‍රහ කරන්න. (ලකුණු 05)

II. කළමනාකරණ ශ්‍රිතයක් හඳුන්වන්න. (ලකුණු 05)

III. බටහිර විද්‍යාත්මක කළමනාකරණයේ වර්ධනය සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 10)

02.

I. කළමනාකරණයට අදාළ මානව සම්බන්ධතා න්‍යායෙහි මූලික සංකල්ප හඳුන්වන්න. (ලකුණු 05)

II. කළමනාකරණය පිළිබඳ විශිෂ්ටතම පිවිසුම මගින් හෙළි කරන ලද කළමනාකරණ සංකල්ප කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05)

III. ඵලදායි පාසලක් සඳහා නිශ්චිත පරමාර්ථ, අරමුණු හා ඉලක්ක තීරණය කිරීමේ වැදගත්කම කළමනාකරණ න්‍යායන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

03.

I. පාසල් පාදක කළමනාකරණය යනු කුමක්ද? (ලකුණු 05)

II. පාසල් පාදක කළමනාකරණයට ආවේණික ලක්ෂණ ලැයිස්තුගත කරන්න. (ලකුණු 05)

III. පාසල් පාදක කළමනාකරණය මගින් පාසලේ ගුණාත්මක බව ඉහළ නැංවිය හැකි අයුරු සාකච්ඡා කරන්න. (ලකුණු 10)

04.

I. 'අභිප්‍රේරණය' හඳුන්වන්න. (ලකුණු 05)

II. ගුරුවරුන් අභිප්‍රේරණය කිරීම සඳහා යොදාගත හැකි ක්‍රම ශිල්ප ලැයිස්තුවක් සකස් කරන්න. (ලකුණු 05)

III. පාසලේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ගුරු අභිප්‍රේරණයේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

05.

I. අධීක්ෂණය හා පාසල් අධීක්ෂණය වෙන් වෙන්ව පැහැදිලි කරන්න. (ලකුණු 05)

II. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අධීක්ෂණයේ දී අධීක්ෂකවරයා සැළකිලිමත් විය යුතු කරුණු පෙළගස්වන්න. (ලකුණු 05)

III. පාසල් අභ්‍යන්තර අධීක්ෂණයේ දී සායනික අධීක්ෂණ ප්‍රවේශය යොදා ගැනීමේ උපයෝගීතාව පැහැදිලි කරන්න. (ලකුණු 10)

06. පහත මාතෘකා **හතරකට (04)** කෙටි සටහන් ලියන්න.

I. නියෝජ්‍ය විදුහල්පති (පරිපාලන)

II. විෂය සමායෝජක

III. පාසල් සංවර්ධන කමිටුව

IV. ඵලදායි පාසලක ලක්‍ෂණ

V. කළමනාකරණ කුසලතා

(ලකුණු 04 x 05 = 20)